# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

<u>ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවීම</u>

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල් අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් e-ඉගෙනුම් ක්‍රමවේදයක් හඳුන්වාදීම උදෙසා ජාතික ඉ-ඉගෙනුම් වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම සහ සමස්ත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය සඳහා විස්තීරණ වූ වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම කොරියානු EXIM බැංකුවෙහි මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක වේ. මෙම "Establishment of ICT Hubs for Secondary Education (GOSL/EDCP)-SRI-31" ව්‍යාපෘතියට අදාළව මාස 27 ක කාලයක් සඳහා පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | වැටුප් මට්ටම | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | A | 1 |
| ප්‍රසම්පාදන විශේෂඥ | C | 1 |
| මූල්‍ය කළමනාකරු | C - I | 1 |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | D | 1 |
| ව්‍යාපෘති නිලධාරී | F | 1 |
| තාක්ෂණ නිලධාරී | F | 1 |
| ව්‍යාපෘති කළමනාකරණ සහායක | කළ.සේ.ච. 02/2026 හි (3:2:3) හි විධිවිධාන අනුව | 3 |
| කාර්යාල කාර්යය සහායක | | 1 |
| රියදුරු | | 1 |

**සියලුම තනතුරු සඳහා පොදු කොන්දේසි**

1. **සුදුසුකම් සහ අයදුම්පත් -** https://moe.gov.lk වෙබ් ලිපිනය මගින් ලබා ගත හැක.

2. **වැටුප් ප්‍රමාණය -** 2026 මාර්තු මස 28 දිනැති කළ.සේ.ච. 02/2026 හි විධිවිධාන අනුව අදාළ ගෙවීම් කිරීම සිදු කරනු ලැබේ.

3. **සේවා නියුක්ති කොන්දේසි**

   a. ව්‍යාපෘති අවශ්‍යතාවය සහ කාර්ය සාධනය මත අලුත් කිරීමට යටත්ව, මාස 27 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම සිදු කෙරේ.

   b. රාජ්‍ය නිලධාරීන්ගෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු සඳහා පූර්ණ කාලීනව නිදහස් කිරීමේ පදනම මත බඳවා ගනු ලබන අතර, අනෙකුත් රාජ්‍ය නිලධාරීන් රජයේ ද්විතීයික පදනම මත සේවාවන්ගෙන් පිටත කොන්ත්‍රාත් පදනමට අනුව නැවත බඳවා ගනු ලැබේ.

   c. සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

   d. අයදුම්කරුවන් තම ජීව දත්ත පත්‍රිකාව අදාළ අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සමඟ

"ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.29 වන දින පස්වරු 3.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු ය.

e. අයදුම්පත බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ වැඩසටහනේ නම (Establishment of ICT Hubs for Secondary Education Project) සහ අයදුම් කරන තනතුර පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල

**<u>රියදුරු (01)</u>**

**බාහිර අයදුම්කරුවන්:**

**<u>අධ්‍යාපනික :</u>**

අවම වශයෙන් දෙවරකදී සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීම සඳහා වන වලංගු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක බර වාහන පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීම සඳහා වන වලංගු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක බර වාහන පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික - අර්ධ පුහුණු (PL 2) හෝ ප්‍රාථමික - නුපුහුණු (PL 1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

PL 3 රු. 43,280 – 10x490 – 10x540 – 10x590 – 12x630 – 67,040/- (DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු.40,834/-)

**බඳවා ගැනීමේ පරිපාටිය:** වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීකෂණයක් මගිනි.

**<u>කාර්යාල කාර්යය සහායක (01)</u>**

**බාහිර අයදුම්කරුවන්:**

**<u>අධ්‍යාපනික:</u>**

අවම වශයෙන් දෙවරකදී හෝ සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. විශ්‍රාම වැටපක් හිමි නොවේ.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය සහ කේතය: PL 1 රු. 40,500 – 10x450 – 10x490 – 7x540 – 15x590 – 62,530/- (DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු.38,488/-)

**බඳවා ගැනීමේ පරිපාටිය:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.